**වී අලෙවි මණ්ඩලය - 2014**

**------------------------------**

වී අලෙවි මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 30 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය ව්‍යාචනය**

**------------------**

මෙම වාර්තාවේ 2.2ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය නිරන්තරයෙන් මිලදීගෙන තිබූ වී තොග වෙළඳපොළ මිලට හා පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම හේතුවෙන් ඊළඟ කන්නයේ වී මිලදීගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම හා අලෙවියෙන් වූ පාඩු පියවා ගැනීමට වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය බැංකු වෙතින් ණය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. 2009 වසරේ සිට 2014 වසර දක්වා වී මිලදී ගැනීම හා මෙහෙයුම් වියදම් සඳහා රජයේ බැංකු 03 කින් ලබාගෙන තිබුණු ණය හා අත්තිකාරම් මුදලින් 2017 ජූනි 20 දින වන විට රු. මිලියන 18,645.3 ක් හා ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 420.8 ක් වී තිබුණි. මේ හේතුවෙන් රජයේ හෝ වෙනත් මූල්‍ය අනුග්‍රහයකින් තොරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම සඳහා පවත්නා අවදානමට බලපෑමක් නොවේය යන්න බැහැර කළ නොහැකි විය.

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් කිරීම

වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා, ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන "C.W.E.Construction and Engineering (Private) Limited" වෙත ආයතනයේ ඉදිකිරීම් කටයුතු පවරා සමාලෝචිත වර්ෂයේදී රු. 298,889,804 ක් ගෙවීම් කර තිබුණ ද එම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

#### ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7

පහත සඳහන් නිරීක්ෂණ හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුල්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේ දී ගැටළු සහගත විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් මුදල් ගලා යාම් රු.2,853,054 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.26,664,302 ක් ලෙස දක්වා තිබීම.

(ආ) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා තිබූ පෙර වර්ෂ ගැලපීම් රු.18,520,161 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ලාභයට ගලපා තිබීම.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් කටයුතු අවසන් වූ මීතොටමුල්ල ගබඩා සංකීර්ණය ඉදිකිරීම හා වැල්ලවාය ගබඩා නවීකරණය සහ ඉඩමෙහි වැට ඉදිකිරීම් සඳහා ගෙවූ රු. 8,286,422 ක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමෙහි ගිණුම්ගත කර තිබුණි.මේ හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි ක්ෂය කිරීමද රු.207,160 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.4,849,303 ක ලී බඩු හා උපකරණ,එම ගිණුමට සටහන් නොකර කෙරීගෙන යන වැඩ ගිණුමට සටහන් කර තිබුණි. මේ හේතුවෙන් ලී බඩු හා උපකරණ ක්ෂය කිරීම්රු.969,860 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී 2013 හා 2014 වර්ෂයන්හීදි පිළිවෙළින් රු.5,965,656 ක් හා රු.5,540,196 ක් රඳවා ගැනීමේ මුදල් ලෙස අඩු කර ගෙන තිබුණද එය ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වී තොගයේ වටිනාකම භෞතිකව සත්‍යාපනය නොකර පොත් ශේෂය වු රු.2,365,549,763 මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඉ) මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2012 වර්ෂයේ සිට ඉදිරියට එන රු.54,385,222 ක් වු මාර්ගස්ථ තොගය, රු.3,302,853 ක් වු සෝයාබෝංචි තොගය හා රු.84,972 ක් වු සහල් තොගය භෞතිකව නොපවතින ශේෂයන් වූයෙන් තොග ශේෂය එකතුව රු.57,773,047 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| හඳුනා නොගත් වී මිලදී ගැනීම් | 73,829,883 | විස්තරාත්මක තොරතුරු, සනාථ කිරීම් |
| ගැනුම් පාලන ගිණුම | 49,743,530 | |
| Rice Millers ණයට විකුණුම් | 68,993,349 | |

**2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට රු.2,271,997,405 ක් වු ණයගැති ශේෂය තුල වසර 5 කට වැඩි රු.60,335,368 ක්,වසර 2 ත් වසර 4 ත් අතර රු.540,850,201ක්, වසර 1 ත් වසර 2 ත් අතර රු.1,454,547,464 ක් හා මාස 6 ට අඩු රු.216,264,372 ක ශේෂ ඇතුළත් වූ අතර එම ශේෂ නිරවුල් කර ගැනීමට 2017 ජූනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී මණ්ඩලය විසින් සහල් අපනයනය සඳහා රු. මිලියන 469.34 ක් වටිනා නාඩු වී කිලෝග්‍රෑම් 12,019,045 ක් සහල් මෝල් වෙත නිකුත් කර තිබුණි. වී නිකුත් කිරීමට අදාලව අමාත්‍යාංශය නමින් විකුණුම් ඉන්වොයිසි පිළියෙල කර නොතිබුණු අතර මෙම වී වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ලැබී තිබුණේ රු. මිලියන 169.46 ක මුදලක් පමණි. ඒ අනුව අපනයනය සඳහා වී සැපයීම වෙනුවෙන් අමාත්‍යාංශයෙන් මණ්ඩලයට රු. මිලියන 299.88 ක් ලැබිය යුතුව පැවතුණි.

(ඇ) 2014 පෙබරවාරි 06 දිනැති අංක DFD/Agri/RiceExp දරන සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව ලෝක ආහාර වැඩසටහන යටතේ සහල් ප්‍රදානය කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී අම්පාර හා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වටිනාකම රු.මිලියන 216.26 ක් වූ නාඩු වී කිලෝග්‍රෑම් 5,028,063 ක් හා සම්බා වී කිලෝග්‍රෑම් 468,726 ක් නිකුත් කර තිබුණු අතර එම මුදල 2017 ජුලි 31 දින වන විටත් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 188(2) | 2012 වර්ෂයේ සිට පැවත එන රු.233,300 ක් වූ උපලබ්ධි නොවූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි395 (ඇ) | මණ්ඩලයේ බැංකු ගිණුම් 08 ක 2016 දෙසැම්බර් මාසය සඳහා වූ බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදය මාස 06 ක් වූ අතර බැංකු ගිණුමක බැංකු සැසඳුම් ප්‍රකාශ 2015 මාර්තු මාසයේ සිට පිළියෙල කර නොතිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 5.4.4 ඡේදය | අත්තිකාරම් ඇපකරයක් තබාගෙන කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 20 ක උපරිමයක් දක්වා වැඩ පූර්ව අත්තිකාරම් ලබාදිය හැකි වුවත් සමාලෝචිත වර්ෂයේදී සිදුකළ ඉදිකිරීම් කොන්ත්‍රාත් 14 ක් සඳහා මණ්ඩලය විසින් කිසිදු අත්තිකාරම් ඇපකරයක් තබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 ක් දක්වා එනම් රු.49,754,113 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ii) 5.4.8 ඡේදය | අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 5 ක කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් ඉහත (i) හි සඳහන් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කාර්යසාධන ඇපකර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් අලාභය රු.1,126,931,765 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.1,036,227,966 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභයෙහි වැඩිවීම රු.90,703,799 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව දළ අලාභය රු.115,040,103 කින් වැඩිවීම ඉහත අලාභය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 857 කින් පිරිහී තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ සියයට 48 කින් මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණු අතර 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ සියයට 9 කින් මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී මණ්ඩලයේ රු.1,003,710,494 ක් වූ සෘණ දායකත්වය 2014 වර්ෂය වනවිට රු.1,078,742,573ක සෘණ දායකත්වයක් දක්වා එනම් සියයට 07 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

මණ්ඩලයේ බැංකු ගිණුම් 04 කට අදාලව 2012 වර්ෂයේ සිට පැවත එන රු.49,177,485 ක් වූ හඳුනා නොගත් තැන්පතු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

2009 ඔක්තෝබර් 02 දිනැති අංක පීඑම්බී/එම්ජ්එච්ජ්/එස්ජ්ආර්එෆ්/2008-09 දරන වී අලෙවි මණ්ඩල චක්‍රලේඛය ප්‍රකාරව නියමිත පරිදි බැංකු ගිණුමට මුදල් බැර වී ඇත්දැයි තහවුරු කර ගැනීමෙන් පසුව මුදල් භාරගැනීමේ කුවිතාන්සි නිකුත් කිරීම හා වී විකිණීමේ නිවේදන නිකුත් කිරීම කළ යුතු වුවත්, එම ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම හේතුවෙන් එකම මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපතට හා ඡායා පිටපතට මණ්ඩලය විසින් රු.9,600,000 ක් වටිනා වී දෙවරක් නිකුත් කර තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය.

### 4.3 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති සියළුම ආයතනවලට අයත් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ සහ නව ඉදිකිරීම් සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අනුබද්ධිත ප්‍රධාන ඉංජිනේරුවරයකු යටතේ ඇති ඉදිකිරීම් අංශයට භාරදෙන ලෙස සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් 2010 සැප්තැම්බර් 06 දින නිකුත් කර තිබූ ලිපියක් පාදක කරගෙන, රු. මිලියන 258.19 ක් වටිනා කොන්ත්‍රාත් 17 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අනුබද්ධිත පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලයේ සභාපති, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවේ සභාපති හා සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ඉහත අනුබද්ධිත සමාගමේ අධ්‍යක්ෂකවරයන් ලෙස පත්කරමින් 2012 මැයි 18 දින මෙම සමාගම සංස්ථා ගත කර තිබුණි.

(ii) ඉහත අනුබද්ධිත සමාගම සතුව ඉදිකිරීම් සම්බන්ධව තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් නොමැතිවීම හේතුවෙන්, එම සමාගම විසින් විනිවිද භාවයෙන් තොරව තෝරාගත් පුද්ගලයන් වෙත ඉහත සඳහන් ඉදිකිරීම් සඳහා උප කොන්ත්‍රාත්තු ලබාදී තිබුණි.

(iii) එම ඉදිකිරීම් සම්බන්ධව සිදුකළ විගණන පරීක්ෂාවේ පහත කරුණු නිරීක්ෂණය විය.

* අක්කරෙයිපත්තුව වී ගබඩාව නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ රු.24,184,502 ක පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීම කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය මත සිදුවී තිබුණි. තවද ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍රය අනුව සියයට 150 සිට සියයට 276 දක්වා ප්‍රමාණ විචලතාවයක් වෙනුවෙන් රු.1,345,328 ක් සහ අවස්ථා 5 ක දී අමතර වැඩ සඳහා රු.559,880 ක් ගෙවා තිබුණි.

* කදුරුවෙල වී ගබඩාව නවීකරණය කිරීම සඳහා වූ පිරිවැය රු.23,074,094 ක කොන්ත්‍රාත්තුවේ උපදේශන ගාස්තු ලෙස රු.600,479 ක මුදලක් සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගමට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු, ප්‍රමාණ පත්‍ර සහ ව්‍යුහගත සැලසුම් සකස් කිරීම සහ කොන්ත්‍රාත්තුව විමර්ෂණය සඳහා මෙකී මුදල් ගෙවා තිබුණත් සකස් කළ ඇස්තමේන්තු සහ ප්‍රමාණ පත්‍ර, කිසිදු සිවිල් ඉංජිනේරුවකු විසින් සහතික කර නොතිබුණි. තවද ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍රය අනුව සියයට 100 සිට සියයට 159 දක්වා වූ ප්‍රමාණ විචලතාවයන් සඳහා රු. 1,337,400 ක් ගෙවා තිබුණි.

(ආ) ඉහත (අ) ඡේදයේ දැක්වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 17 ට අමතරව පිරිවැය ඇස්තමේන්තුව රු.41,140,418 ක් වූ කිලිනොච්චිය වී ගබඩාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමූපකාර තොග වෙළඳ සංස්ථාව හරහා අනුබද්ධිත පෞද්ගලික සමාගම වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ගබඩාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු සකස් කිරීමේ දී හඳුනාගත හැකිව තිබුණු කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම, මාර්ග සකස් කිරීම, දැල් වැටවල් ඉදිකිරීම, ජල ටැංකි ඉදිකිරීම සහ ගෙවතු අලංකරණය සඳහා රු. 8,252,330 ක මුදලක් කොන්ත්‍රාත්තුවේ අමතර වැඩ ලෙස හඳුනාගෙන තිබීම නිසා එම ඉදිකිරීම් වෙනුවෙන් වැඩි මිලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ii) මණ්ඩලය මඟින් මෙම ඉදිකිරීම් අධීක්ෂණය සහ අනිකුත් කාර්යයන් සඳහා ඉංජිනේරු උපදේශකවරයකු අර්ධ කාලීන පදනම මත යොදවා තිබියදී මෙම කොන්ත්‍රාත්තුවේ උපදේශන සේවා සඳහා සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගම වෙතද රු.2,088,486 ක මුදලක් ගෙවා තිබුණි. තවද,මෙම කොන්ත්‍රාත්තුවේ මූලික ඇස්තමේන්තු සහ ප්‍රමාණ පත්‍ර (BOQ) කොන්ත්‍රාත්තුව සිදුකළ සමාගම විසින් සකස් කර තිබුණි. එම ඇස්තමේන්තුව පරීක්ෂා කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය මඟින් පත්කළ උපදේශක වෙත රු.5,000 ක දීමනාවක් ගෙවා තිබුණ ද කිසිදු පුද්ගලයකු මෙකී ඇස්තමේන්තු සහතික කර නොතිබුණි.

(iii) වැඩ බිමේ ඉතිරි වූ තොග වෙනුවෙන් ගෙවීම් කිරීමට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම්ගත වී නොතිබියදී සහ කොන්ත්‍රාත්කරු ලබාදෙන තොග ලේඛනය වැඩ බිමට ගෙන ගොස් පරීක්ෂා කිරීමකින් හා කොන්ත්‍රාත්කරු විසින් එම ද්‍රව්‍ය මිලදී ගත් බිල්පත් පරීක්ෂා කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරු මුදල් ඉල්ලීම් කර නොතිබූ අවස්ථා 02 කදී වැඩ බිමේ ඉතිරි වූ ද්‍රව්‍ය වෙනුවෙන් රු. 12,904,400 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 මාර්තු 02 දිනදීය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වු පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වාහන පාලනය | ධාවන සටහන්, ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| (ආ) කොන්ත්‍රාත් පැවරුම් සහ ක්‍රියාත්මක කිරීම. | ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව කටයුතු කිරීම. |
| (ඇ) ගබඩා පරිපාලනය | (i) නිසි ප්‍රමිතියකින් යුතුව වී ගබඩා නොකිරීම හා ගබඩාවල ඇති අඩුපාඩු සකස්කර නොගැනීම.<br>(ii) ගබඩා පාලනය සම්බන්ධ උපදෙස් ගබඩා භාර නිලධාරීන්ට ලබා නොදීම. |
| (ඈ) බැංකු සැසඳුම් | බැංකු සැසඳුම් ප්‍රමාද වී පිළියෙල කිරීම. |
| (ඉ) වී විකිණීමේ ක්‍රියාවලිය | විකුණුම් ඉන්වොයිසි පිළියෙල නොකිරීම. |